# නිදහස් වෙළඳ කලාප සහ පොදු සේවා සේවක සංගමය
சுதந்திர வர்த்தக வலய மற்றும் பொது சேவைகள் தொழிலாளர் சங்கம்
FREE TRADE ZONES & GENERAL SERVICES EMPLOYEES UNION


2022 නොවැම්බර් මස 08 වන දින.

සියලු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙත,

හිතවත් මන්ත්‍රීතුමනි/මන්ත්‍රීතුමියනි,

**රුපියල් කෝටි සිය ගණනින් ආදායම් හා වැට් (VAT) බදු නොගෙවන ජාවාරම්කාරයින්ගේ තොරතුරු හා වහා ගත යුතු පියවර සම්බන්ධයෙනි**

මහනුවර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී මහින්දානන්ද අලුත්ගමගේ විසින් මේ රටේ බදු වංචා කිරීම් පිළිබඳව වැදගත් තොරතුරු ප්‍රමාණයක් සමගින් මීට මාස එක හමාරකට පෙර ඉකුත් සැප්තැම්බර 20 වන දින පාර්ලිමේන්තුවේදී බරපතල හෙළිදරව්වක් කළේය. ආණ්ඩුව හා මුදල් අමාත්‍යාංශය ඒ බදු වංචා සම්බන්ධව කිසිදු ප්‍රසිද්ධ ප්‍රකාශයක් හෝ සවිස්තර වාර්තාවක් මෙතෙක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් නොකිරීම නිසා එම තොරතුරු සත්‍යය යැයි පිළිගැනීමට අපට සිදු වන්නේය. අප අද මුහුණ දෙන ආර්ථික බිඳ වැටීමට මේ දූෂිත ජාවාරම්කාරයින් වගකීමට බැඳ තබන්නට ඒ අනුව ආණ්ඩුව පියවර ගත යුතුව ඇත.

එදින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ තොරතුරු අනුව,

01. ආදායම් බදු ලිපිගොනු ඇති ව්‍යාපාරික සමාගම් 100,005 කින් බදු ගෙවා ඇත්තේ සමාගම් 25,692 ක් පමණි. ඒ අනුව සමාගම් 74,313 ක් බදු ගෙවා නැත.

02. VAT බදු වෙනුවෙන් ලියාපදිංචි ව්‍යාපාර 60,721 ක් ඇති අතර ඔවුන් පාරිභෝගිකයින්ගෙන් අය කරගනු ලැබූ VAT බදු පසුගිය සැප්තැම්බර් වන විට ආණ්ඩුවට භාරදී ඇත්තේ ව්‍යාපාර 185 ක් පමණි. ඉන් කියවෙන්නේ, ඉතිරි ව්‍යාපාර 60,536 විසින් පාරිභෝගිකයින්ගෙන් අය කරගනු ලැබූ VAT බදු ඔවුන් සන්තක කරගෙන ඇත යන්නයි.

03. ඉහළ පෙළේ නිමි ඇඳුම් ජාලයක් හිමි ව්‍යාපාරිකයෙකු සහ එවැනිම ඉහළ පෙළේ සුප(ර්) මාකට් ජාලයක් ආදායම් බදු කිසිවක් ගෙවා නැත.

04. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් 75 දෙනෙකු ආදායම් බදු ගෙවන්නේ නැත.

අලුත්ගමගේ මන්ත්‍රීවරයා එකී හෙළිදරුව්වෙන් කුමක් බලාපොරොත්තු වූවත් සියයට 83 ක් වක්‍ර බදු අය කෙරෙන මේ රටේ සාමාන්‍ය ජනතාව විශාල වශයෙන් පීඩාවට පත් වන්නේ රුපියල් කෝටි සිය ගණනින් සිදුවන මෙවැනි බදු වංචා හේතුවෙනි. රජයට එළෙසින් අහිමිවන දේශීය ආදායම් පියවා ගැනීමට කිසිදු ආණ්ඩුවක් කිසිදු වැදගත් හා සාර්ථක පියවරක් නොගන්නා හෙයින් ජාවාරම්කාරයින් විසින් ආදායම් වංචා කිරීමේ පාඩුවට මුහුණ දිය යුත්තේ ජනතාවය. ඊට පිළියම් වශයෙන් ජාවාරම්කරුවන්ගෙන් දඩ මුදල් සමග හිඟ බදු




141 ආනන්ද රාජකරුණා මාවත, කොළඹ10
ஆனந்த ராஜகருணா மாவத்த, கொழும்பு10
Ananda Rajakaruna Mawatha, Colombo10
+94 11 2693283 www.ftzunionlanka.org
+94 11 4617711 ftzunionlanka@gmail.com
ලි.ස. අංකය பதிவு இல. Reg. No 7223

අයකර ගැනීම වෙනුවට ආණ්ඩු විසින් වක්‍ර බදු අය කිරීමෙන් දඩුවම් කරන්නේ නැවතත් සාමාන්‍ය ජනතාවටම ය.

මෙම හෙළිදරව්වෙන් පසු ගෙවුනු මාසයකුත් දෙසතියකට වැඩි කාලයේ පාර්ලිමේන්තුවේ නියෝජනය වන දේශපාලන පක්ෂ කිසිවක් ප්‍රසිද්ධියේ තබා පාර්ලිමේන්තුවේ හෝ ඒ බදු වංචා ගැන කතා කළ බවක් අපි නොදනිමු. කිසිදු මන්ත්‍රීවරයෙකුද ඒ ගැන කතා කළ බවක් අසන්නට නැත. අප විශ්වාස කරන අයුරු මේ කාරණාව සම්බන්ධයෙන් විශේෂයෙන් විපක්ෂයෙහි ඉන්නා දේශපාලන පක්ෂ වහා එක් දිනක හෝ පාර්ලිමේන්තු විවාදයක් ඉල්ලා සිටිය යුතුව තිබිණ.

එවැනි කිසිවක් මෙතෙක් පාර්ලිමේන්තුවේ සිදු නොවුනු හෙයින්, මේ රටට විදේශ විනිමය උපයන අපනයන නිෂ්පාදන ක්ෂේත්‍රයෙහි ලක්ෂ පහකට වැඩි සේවක සේවිකාවන්ගේ සහ අනෙකුත් ක්ෂේත්‍රවල සේවක සේවිකාවන්ගේ අයිතීන් හා ගැටළු වෙනුවෙන් පෙනී සිටින වෘත්තීය සමිතියක් වශයෙන් හා ජාතික කම්කරු උපදේශක සභාවේ සාමාජික වෘත්තීය සමිතියක්ද වශයෙන් 2022 නොවැම්බර් මස 06 වන ඉරිදා දින රැස්වූ අප සංගමයේ මහ මණ්ඩලය විසින් ගත් තීන්දුව මත අප ඔබගෙන් ඉල්ලා සිටින්නේ,

01. ඉදිරි අයවැයට පෙර ඉහතින් සඳහන් බදු වංචා වලට අදාල ව්‍යාපාරිකයින්ගේ නම් සමග සවිස්තරාත්මක වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන මෙන් මුදල් ඇමතිවරයාගෙන් වහා ඉල්ලා සිටින්නට කටයුතු කරන ලෙසත්

02. එම තොරතුරු ප්‍රකාශයට පත්කර ඒ සම්බන්ධ ජාතික කම්කරු උපදේශක සභාවෙහි අවසන් තීන්දුවක් ගන්නා තෙක් රුපියල් ලක්ෂයක් හෝ ඊට වැඩි මාසික පෞද්ගලික ආදායම් සඳහා පනවා ඇති ආදායම් බද්ද වහා අත්හිටුවන්නටත්

03. අත්‍යාවශ්‍ය පාරිභෝගික භාණ්ඩ සඳහා පනවා ඇති VAT බද්ද සම්පූර්ණයෙන් ඉවත් කරන්නට සහ ඉකුත් ඔක්තෝම්බර් 01 වන දින සිට ක්‍රියාත්මක කෙරෙන සියයට 2.5 ක සමාජ සංරක්ෂණ දායකත්ව බද්ද වහා අත්හිටුවන්නටත්

පාර්ලිමේන්තුවේ යෝජනා සම්මත කිරීමට නොපමාව පියවර ගන්නා මෙන් ය.

ඒ වෙනුවෙන් ඔබේ විශේෂ අවධානය සමග මැදිහත්වීමක් වහා සිදුවෙතැයි අපි විශ්වාස කරමු.

මේ පිළිබඳව ඔබ ගන්නා පියවර සම්බන්ධයෙන් අප සංගමය දැනුවත් කරන මෙන් ද ගෞරවයෙන් ඉල්ලා සිටිමු. තවද, මෙම ලිපිය ඔබ වෙත ලැබුණු බව තහවුරු කරන්නේ නම් අගය කර සළකන්නෙමු.

ස්තුතියි.

මෙයට විශ්වාසී

ඇන්ටන් මාකස්
සම ලේකම්
නිදහස් වෙළඳ කලාප සහ
පොදු සේවා සේවක සංගමය
මහා මණ්ඩලයේ තීරණය පරිදි

KLK

**පිටපත් :-** සියළු ජනමාධ්‍ය වෙත

KLK